# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2467/69 - 2025 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා - 2025.12.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) ව්‍යවස්ථාව හා 57 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

**බලතල පැවරීම**

01. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි "අ" උපලේඛනයේ, I කොටසේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති නිලධර ගණය / ඛණ්ඩය සම්බන්ධයෙන් එහි II තීරුවෙහි දක්වා ඇති බලතල, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධ්‍යාපන සේවා කමිටුව වෙත මෙයින් පවරා දෙනු ලැබේ.

(2) අධ්‍යාපන සේවා කමිටුව යන්නෙන් අංක 1989/27 හා 2016.10.19 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත, 2016.10.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ස්ථාපිත කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව අදහස් වේ.

02. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි "අ" උපලේඛනයේ, I කොටසේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති නිලධර ගණය / ඛණ්ඩය සම්බන්ධයෙන් එහි II තීරුවෙහි දක්වා ඇති බලතල, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය සේවා කමිටුව වෙත මෙයින් පවරා දෙනු ලැබේ.

(2)සෞඛ්‍ය සේවා කමිටුව යන්නෙන් අංක 1990/25 හා 2016.10.27 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත, 2016.11.01 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ස්ථාපිත කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව අදහස් වේ.

03. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි "අ" උපලේඛනයේ II කොටසෙහි I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති නිලධර ගණය / ඛණ්ඩය සම්බන්ධයෙන් එහි III තීරුවෙහි දක්වා ඇති බලතල, එහි II තීරුවෙහි දක්වා ඇති රාජ්‍ය නිලධාරීන් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.


1A - PG 7418 — 13 (2025/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි “ආ” උපලේඛනයේ II කොටසෙහි I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති නිලධර ගණය / ඛණ්ඩය සම්බන්ධයෙන් එහි III තීරුවෙහි දක්වා ඇති බලතල, එහි II තීරුවෙහි දක්වා ඇති රාජ්‍ය නිලධාරීන් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.

05. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි “ඇ”උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති නිලධර ගණය / ඛණ්ඩය සම්බන්ධයෙන් එහි III තීරුවෙහි දක්වා ඇති බලතල, එහි II තීරුවෙහි දක්වා ඇති රාජ්‍ය නිලධාරීන් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.

06. විනය පාලනය සහ / හෝ සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් බලතල පවරනු ලැබ ඇති “අ” උපලේඛනයේ I කොටසේ හෝ “ආ” උපලේඛනයේ I කොටසේ සඳහන් කමිටුවක සාමාජිකයකු “අ” උපලේඛනයේ I කොටසේ හෝ “ආ” උපලේඛනයේ I කොටසේ I වන තීරුවට අනුරූපී නිලධර ගණයකට / ඛණ්ඩයකට අයත් නිලධරයෙකු සම්බන්ධයෙන් වන ඕනෑම විධිමත් විනය පරීක්ෂණයකදී සහ / හෝ මූලික විමර්ශනයකදී පැමිණිලිකරුවකු හෝ සාක්ෂිකරුවකු හෝ විභව්‍ය සාක්ෂිකරුවකු වන්නේ නම්, එම කමිටුවට එලෙස විනය පාලනය සහ /සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති බලතල ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇතැයි සැලකිය යුතු වන අතර එකී කමිටුවට එවැනි කිසිදු බලතල පැවරීමක් සිදු කර නොමැති සේ සලකා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එකී බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේය.

07. විනය පාලනය සහ / හෝ සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් බලතල පවරනු ලැබ ඇති “අ” උපලේඛනයේ II කොටසේ හෝ “ආ” උපලේඛනයේ II කොටසේ හෝ “ඇ” උපලේඛනයේ හෝ සඳහන් රජයේ නිලධරයකු, “අ” උපලේඛනයේ II කොටසේ සහ “ආ” උපලේඛනයේ II කොටසේ සහ “ඇ” උපලේඛනයේ I වන තීරුවට අනුරූපී නිලධර ගණයකට / ඛණ්ඩයකට අයත් නිලධරයෙකු සම්බන්ධයෙන් වන ඕනෑම විධිමත් විනය පරීක්ෂණයකදී සහ / හෝ මූලික විමර්ශනයකදී පැමිණිලිකරුවකු හෝ සාක්ෂිකරුවකු හෝ විභව්‍ය සාක්ෂිකරුවකු වන්නේ නම්, එම නිලධරයාට එලෙස විනය පාලනය සහ / හෝ සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති බලතල ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇතැයි සැලකිය යුතු වන අතර එකී රජයේ නිලධරයෙකුට එවැනි කිසිදු බලතල පැවරීමක් සිදු කර නොමැති සේ සලකා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එකී බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේය.

**කොන්දේසි**

08. මෙහි පවරා ඇති සියලුම බලතල ක්‍රියාත්මක කිරීමේදී අදාළ උපදෙස්, රීති හා රෙගුලාසි සහ පහත සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු වන්නේය.

(1.) (අ) බලය අභිනියෝජිත බලධරයා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල II වන පරිච්ඡේදයේ 12,13,14,15,16,17,18,19,20,21 වගන්තිවල සහ XX වන පරිච්ඡේදයේ 288 සහ 289 වගන්තිවල විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

(ආ) ඉහත (අ) ඡේදයේ දක්වා ඇති, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල අදාළ වගන්ති, මෙහි “ඈ” උපලේඛනයේ දක්වා ඇත්තේය.

(2.) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි, කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අදාළව පාර්ලිමේන්තුව වෙත තම වගකීම හා වගවීම ඉටු කිරීම සඳහා අහඹු ලෙස තෝරාගත් සිද්ධීන් නියැදියකට හෝ නිශ්චිත සිද්ධියකට අදාළව, අදාළ බලධරයන් විසින් මෙයින් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන සියලු ලේඛන පරීක්ෂාව සඳහා ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව විසින් වරින් වරට අදාළ බලය අභිනියෝජිත බලධරයින්ට නියම කළ හැකිය.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි බලය අභිනියෝජිත බලධරයින් විසින් (අ) ඡේදයේ සඳහන් වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(3.) කිසිදු බලය අභිනියෝජිත බලධරයෙක්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව අභිනියෝජිත බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන කිසිදු නීති කෘත්‍යකදී කිසිදු පාර්ශවයක් සමග සමථයකට නොඑළඹිය යුතුය.

(4.) යම් අමාත්‍යාංශයක ලේකම්වරයෙක් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් බලතල පවරනු ලැබීම පිණිස එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු නම් කරන අවස්ථාවකදී, එකී අතිරේක ලේකම්වරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධිමත්ව තනතුරට පත් කරනු ලැබ තිබිය යුතුය.

09. බලතල පැවරීම, වර්ෂ දෙදහස් විසිහයේ ජනවාරි මස පළවෙනි දින සිට (මින් මතුවට 'බලාත්මක වන දිනය' ලෙස හඳුන්වනු ලබන) ක්‍රියාත්මක විය යුතු වන්නේය.

**ඉවත් කිරීම් සහ රඳවා ගැනීම්**

10. (අ). මෙම බලතල පැවරීම ක්‍රියාත්මක වන දින සිට පහත සඳහන් අංක හා දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයන්හි* පළ කරන ලද බලතල පැවරීම් එම *ගැසට් පත්‍රයන්හි* පළ කරන ලද බලතල පැවරීම යටතේ ගන්නා ලද හෝ ගනු ලැබ ඇතැයි සැලකෙන යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

i. අංක 1941/41 දරන 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
ii. අංක 1955/22 දරන 2016.02.25 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
iii. අංක 1989/29 දරන 2016.10.19 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
iv. අංක 1990/24 දරන 2016.10.27 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
v. අංක 1992/7 දරන 2016.11.07 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
vi. අංක 2004/49 දරන 2017.02.01 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
vii. අංක 2014/3 දරන 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
viii. අංක 2016/37 දරන 2017.04.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
ix. අංක 2043/13 දරන 2017.10.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
x. අංක 2074/45 දරන 2018.06.08 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
xi. අංක 2131/60 දරන 2019.07.13 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
xii. අංක 2131/61 දරන 2019.07.13 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
xiii. අංක 2227/4 දරන 2021.05.10 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
xiv. අංක 2248/10 දරන 2021.10.04 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
xv. අංක 2312/41 දරන 2022.12.29 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
xvi. අංක 2365/65 දරන 2024.01.04 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*
xvii. අංක 2373/33 දරන 2024.02.29 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය*

(ආ). ඉහත (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති *ගැසට් නිවේදන* ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුව ද, එකී *ගැසට්* නිවේදන යටතේ බලය අභිනියෝජනය කරන ලද බලධරයින් විසින් හෝ බලධරයින්ට එරෙහිව මෙම *ගැසට්* නිවේදනය බලාත්මක වන දිනට පවත්වාගෙන යනු ලබන සියලුම නඩු පැවරීම්, ක්‍රියාමාර්ග, විනය ක්‍රියාපටිපාටි, කාරණා මෙම *ගැසට්* නිවේදනය අනුව සිදු කරන ලද බලය අභිනියෝජනය යටතේ කරන ලද ක්‍රියාවන් සේ සලකා අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**ඩබ්.එච්.එම්.එම්.සී.කේ.දයාරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 දෙසැම්බර් මස 19 වැනි දින,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**"අ" උපලේඛනය**

අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන සේවාවල නිලධරයන්

**I කොටස**

අධ්‍යාපන සේවා කමිටුව

(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පැවරීම)

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|
| 1. පහත සේවාවන්ට අයත් නිලධරයන්<br>අ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්<br>ආ. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, පහත නිලධර ගණයන්ට අයත් නිලධරයන්<br>i. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධරයන්<br>ii. දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජොෂ්ඨ මට්ටමේ නිලධරයන්<br>ඇ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජොෂ්ඨ මට්ටමේ නිලධරයන් | i. අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා /දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට උසස් කිරීම<br>vi. III ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදයක් මගින් කරනු ලබන පත් කිරීම<br>vii. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව I ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම<br>viii. තනතුරක වැඩ බැලීමට/රාජකාරි ඉටු කිරීමට පත් කිරීම<br>ix. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>x. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>xi. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>xii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 2. පහත සේවාවන්ට අයත් I ශ්‍රේණියට පහළ නිලධරයන් සහ III හෝ II ශ්‍රේණිවල තනතුරු දරන I ශ්‍රේණියේ නිලධරයන්<br>අ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්<br>ආ. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, පහත නිලධර ගණයන්ට අයත් නිලධරයන්<br>i. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධරයන්<br>ii. දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජොෂ්ඨ මට්ටමේ නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 263 සිට 266 වගන්තිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) |

| I තීරුව<br>නිලධර ගණය / ඛණ්ඩය | II තීරුව<br>පවරන ලද බලතල |
|---|---|
| ඈ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | |
| 3. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් | i. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම |
| 4. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | i. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව තනතුරට පත් කිරීම (අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ අතිරේක ලේකම් තනතුරු හැර අනෙකුත් තනතුරු)<br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 258 සිට 266 වගන්තිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම (258 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) |
| 5. පහත සේවාවන්ට අයත් I ශ්‍රේණියේ තනතුරු දරන I ශ්‍රේණියේ නිලධරයන්<br>අ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්<br>ආ. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, පහත නිලධර ගණයන්ට අයත් නිලධරයන්<br>i. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධරයන්<br>ii. දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්<br>ඇ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 258 සිට 266 වගන්තිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම (258 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) |
| 6. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන් සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් | i. අනුමත සේවා ව්‍යවස්ථා අනුව ජාතික පාසලක විදුහල්පති තනතුරට පත් කිරීම<br>ii. ජාතික පාසලක විදුහල්පති තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව පළාත් රාජ්‍ය සේවයට ද්විතීයන පදනම මත මුදා හැරීම |
| 7. ජාතික පාසල්වල විදුහල්පතිවරුන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම |
| 8. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>iii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|
| | iv. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>v. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 263 සිට 266 වගන්තිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව)<br>vi. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 9. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට පහළ නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව II ශ්‍රේණියේ නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම |
| 10. දැනටමත් අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>iii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 11. දැනටමත් අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට පහළ ශ්‍රේණිවල නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව II ශ්‍රේණියේ නිලධරයන් අධිසේවක පදනම මත I ශ්‍රේණියට උසස් කිරීම |
| 12. ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව II ශ්‍රේණියේ නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම |
| 13. ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම |
| 14. අ. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | i. නිත්‍ය තනතුරට අමතරව තනතුරක අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ වැඩ බැලීමට පත් කිරීම<br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>iii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|
| ආ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | iv. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>v. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 263 සිට 266 වගන්තිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව)<br>vi. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 15. අ. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ, ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන්<br><br>ආ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ, ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම<br>iii. තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම |

## II කොටස

*(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පැවරීම)*

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 1. පහත සේවාවන්ට අයත් නිලධරයන්<br>අ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්<br>ආ. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, පහත නිලධර ගණයන්ට අයත් නිලධරයන්<br>i. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධරයන්<br>ii. දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව III ශ්‍රේණියේ හෝ III/II ශ්‍රේණිවල ඒකාබද්ධ තනතුරකට පත් කිරීම (පවත්නා පුරප්පාඩු සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදයක් මගින් කරනු ලබන පත් කිරීම් හැර)<br>iii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br>iv. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| ඇ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | | |
| 2. පහත සේවාවන්ට අයත් I ශ්‍රේණියට පහළ නිලධරයන් හා III හෝ II ශ්‍රේණිවල තනතුරු දරන I ශ්‍රේණියේ නිලධරයන්<br>අ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්<br>ආ. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, පහත නිලධර ගණයන්ට අයත් නිලධරයන්<br>i. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධරයන්<br>ii. දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්<br>ඇ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| 3. පහත සේවාවන්ට අයත් I ශ්‍රේණියේ තනතුරු දරන I ශ්‍රේණියේ නිලධරයන්<br>අ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්<br>ආ. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, පහත නිලධර ගණයන්ට අයත් නිලධරයන්<br>i. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධරයන්<br>ii. දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [258 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (258 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| ඇ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | | |
| 4. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [258 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (258 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| 5. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව තනතුරුවලට පත් කිරීම (ජාතික පාසල් විදුහල්පති තනතුරු හැර)<br>iii. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම (ජාතික පාසල් විදුහල්පති තනතුරු හැර)<br>iv. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br>v. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ]<br>vi. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 6. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට පහළ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>iv. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව III ශ්‍රේණියේ නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව තනතුරුවලට පත් කිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | | vi. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>viii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව පළාත් රාජ්‍ය සේවයට ද්විතීයන පදනම මත මුදා හැරීම<br>ix. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>x. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>xi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>xii. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 7. දැනටමත් අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම (අධිසේවක පදනම මත පත් කරනු ලැබ ඇති විදුහල්පතිවරුන් දරන තනතුරු අතර පමණි.)<br>iv. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 8. දැනටමත් අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට පහළ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. සේවය ස්ථිර කිරීම<br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>iii. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව අධිසේවක පදනම මත III ශ්‍රේණියේ නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම<br>iv. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>v. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම (අධිසේවක පදනම මත පත් කරනු ලැබ ඇති විදුහල්පතිවරුන් දරන තනතුරු අතර පමණි.)<br>vi. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |

| I තීරුව<br>නිලධර ගණය / ඛණ්ඩය | II තීරුව<br>බලතල පවරනු ලබන<br>රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 9. ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>v. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>vi. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>viii. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 10. ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීම<br>ii. පත්වීම අවසන් කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>v. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>vii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | i. සේවයේ ස්ථිර කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව උසස් කිරීම<br>iii. අනුමත සේවා ව්‍යවස්ථාවේ 7.2.6 වගන්තිය අනුව ශ්‍රේණියකට පත් කිරීම<br>iv. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>v. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය ලබා දීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 11.අ. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්<br><br>ආ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ]<br>iii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 12. අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ, ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පටිපාටි අනුව උසස් කිරීම (තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර)<br>vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>vii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>viii. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>ix. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>x. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 13. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ, ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් | අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් | i. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | | v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පටිපාටි අනුව උසස් කිරීම (තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර)<br>vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>vii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>viii. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>ix. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>x. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම. |

**"ආ" උපලේඛනය**

**සෞඛ්‍ය/ආයුර්වේද විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන සේවාවල නිලධරයන්**

**I කොටස**

සෞඛ්‍ය සේවා කමිටුව

*(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පැවරීම)*

| I තීරුව<br>*නිලධර ගණය / ඛණ්ඩය* | II තීරුව<br>*පවරන ලද බලතල* |
|---|---|
| 1. පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධරයන්<br>(අ) ශ්‍රී ලංකා වෛද්‍ය සේවය<br>(ආ) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | i. අනුමත සේවා ව්‍යවස්ථා අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා / දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම.<br>v. ශ්‍රී ලංකා වෛද්‍ය සේවා ව්‍යවස්ථාව හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාව අනුව II ශ්‍රේණියට උසස් කිරීම් හැර අනෙකුත් සියලු උසස් කිරීම් සිදු කිරීම<br>vi. අනුමත සේවා ව්‍යවස්ථා අනුව වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම (සෞඛ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා වෛද්‍ය සේවයට අයත් අතිරේක ලේකම් තනතුරු හැර)<br>vii. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>viii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>ix. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම |

| I තීරුව<br>*නිලධර ගණය / ඛණ්ඩය* | II තීරුව<br>*පවරන ලද බලතල* |
|---|---|
| | x. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ පළමු වන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>xi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම<br>xii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 2. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට / ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | i. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා / දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා වන කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම<br>vi. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව තනතුරට පත් කිරීම<br>vii. තනතුරක වැඩ බැලීමට/රාජකාරි ඉටු කිරීමට පත් කිරීම<br>viii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>ix. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>x. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ පළමු වන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>xi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම<br>xii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 3. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට / ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | i. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව තනතුරට පත් කිරීම<br>ii. නිත්‍ය තනතුරට අමතරව අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට පත් කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>iv. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>v. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ පළමු වන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>vii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |

| I තීරුව<br>*නිලධර ගණය / ඛණ්ඩය* | II තීරුව<br>*පවරන ලද බලතල* |
|---|---|
| 4. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට / ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් අමාත්‍යාංශ ලේකම්වරයා / දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පවරා ඇති බලතලවලින් ඔබ්බට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම<br>iii. තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ තනතුරුවල වැඩ බැලීමට/රාජකාරි ඉටු කිරීමට පත් කිරීම |

## II කොටස

(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පැවරීම)

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 1. පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධරයන්<br>(අ) ශ්‍රී ලංකා වෛද්‍ය සේවය<br>(ආ) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | සෞඛ්‍ය / ආයුර්වේද විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. අනුමත සේවා ව්‍යවස්ථා අනුව II ශ්‍රේණියට උසස් කිරීම<br>iii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතට ගැනෙන විනය පාලනය<br>iv. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 2. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට / ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | සෞඛ්‍ය / ආයුර්වේද විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>ii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතට ගැනෙන විනය පාලනය<br>iii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 3. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට / ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවාවකට අයත් නොවන අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | සෞඛ්‍ය / ආයුර්වේද විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br>ii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 4. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන (ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධරයන් හැර), ඒකාබද්ධ සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ හා ද්විතියික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම (තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ උසස්වීම් හැර)<br>vi. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>viii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>ix. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>x. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම<br>xi. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 5. ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවාවකට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් | ආයුර්වේද කොමසාරිස් ජනරාල් | i. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම (තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර)<br>vi. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>viii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>ix. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>x. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු සිදු කිරීම<br>xi. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |

*"ඇ" උපලේඛනය*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පැවරීම*

| *I තීරුව*<br>*නිලධර ගණය / බණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 1. පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධරයන්<br>(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>(ආ) ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය<br>(ඇ) ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය<br>(ඈ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>(ඉ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>(ඊ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි 127 සහ 128 වගන්ති යටතේ පරිවාස කාලය දීර්ඝ කිරීම්වලට යටත් වන ස්ථිර කිරීම් හැර, සේවයේ ස්ථිර කිරීම<br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>iii. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති බව සඳහන් කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි 145 වන වගන්තිය අනුව ලිපි නිකුත් කිරීම<br>iv. අනුමත සේවා ව්‍යවස්ථා අනුව II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට උසස් කිරීම<br>v. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br>vi. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| (උ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| (ඌ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | පශු සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| (එ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | ඉඩම් මැනුම් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| 2. පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් I ශ්‍රේණියට පහළ නිලධරයන් සහ III හෝ II ශ්‍රේණිවල තනතුරු දරන I ශ්‍රේණියේ නිලධරයන්<br>(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>(ආ) ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය<br>(ඇ) ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය<br>(ඈ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>(ඉ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>(ඊ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථා අනුව III ශ්‍රේණියේ තනතුරකට හෝ III/II ශ්‍රේණිවල ඒකාබද්ධ තනතුරකට පත් කිරීම (පවත්නා පුරප්පාඩු සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදයක් මඟින් කරනු ලබන පත් කිරීම් හැර)<br>ii. නිත්‍ය තනතුරට අමතරව මාස තුනකට නොවැඩි කාලයක් සඳහා III ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට/ රාජකාරි ඉටු කිරීමට පත් කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| (උ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| (ඌ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | පශු සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| (එ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | ඉඩම් මැනුම් විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| 3. පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධරයන් හා විශේෂ ශ්‍රේණියේ තනතුරු දරන නිලධරයන්<br>(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>(ආ) ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය<br>(ඇ) ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය<br>(ඈ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>(ඉ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>(ඊ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | රාජ්‍ය පරිපාලන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [258 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (258 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| (උ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| (ඌ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | පශු සම්පත් සංවර්ධන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| (එ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | ඉඩම් මැනුම් විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | |
| 4. දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | අදාළ නිලධරයන් අයත් වන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 127 සහ 128 වගන්ති යටතේ පරිවාස කාලය දීර්ඝ කිරීම්වලට යටත් වන ස්ථිර කිරීම් හැර, සේවයේ ස්ථිර කිරීම<br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>iii. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති බව සඳහන් කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 145 වන වගන්තිය අනුව ලිපි නිකුත් කිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | | iv. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පටිපාටි අනුව II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට උසස් කිරීම<br>v. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br>vi. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 5. දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති පහත සඳහන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්<br>(අ) I ශ්‍රේණියට පහළ නිලධරයන්<br>(ආ) III/ II ශ්‍රේණිවලට අයත් තනතුරු දරන I ශ්‍රේණියේ නිලධරයන් | අදාළ නිලධරයන් අයත් වන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පටිපාටි අනුව III ශ්‍රේණියේ තනතුරකට හෝ III/II ශ්‍රේණිවල ඒකාබද්ධ තනතුරකට පත්කිරීම (පවත්නා පුරප්පාඩු සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදයක් මගින් කරනු ලබන පත්කිරීම් හැර)<br>ii. නිත්‍ය තනතුරට අමතරව මාස තුනකට නොවැඩි කාලයක් සඳහා III ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට/ රාජකාරී ඉටුකිරීමට පත්කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| 6. දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ I ශ්‍රේණියේ තනතුරු දරන නිලධරයන් හා විශේෂ ශ්‍රේණියේ තනතුරු දරන නිලධරයන් | අදාළ නිලධරයන් අයත් වන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [258 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (258 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| 7. ඒකාබද්ධ සේවයට අයත්, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ /විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් | i. නිත්‍ය තනතුරට අමතරව මාස තුනකට නොවැඩි කාලයක් සඳහා අධි ශ්‍රේණියේ /විශේෂ ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට පත්කිරීම<br>ii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | | iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ]<br><br>iv. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 8. ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්<br><br>(ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයන් හැර) | අදාළ නිලධරයන් අයත් වන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. නිත්‍ය තනතුරට අමතරව මාස තුනකට නොවැඩි කාලයක් සඳහා අධි ශ්‍රේණියේ /විශේෂ ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට පත් කිරීම<br><br>ii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br><br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ]<br><br>iv. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම |
| 9. ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයන් | ස්වදේශ කටයුතු/ රාජ්‍ය පරිපාලන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. නිත්‍ය තනතුරට අමතරව මාස තුනකට නොවැඩි කාලයක් සඳහා අධි ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට පත් කිරීම<br><br>ii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br><br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ]<br><br>iv. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වගන්තිය යටතේ වන විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |

| I තීරුව<br>නිලධර ගණය / ඛණ්ඩය | II තීරුව<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 10. ඒකාබද්ධ සේවයට අයත්, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් | i. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම (තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර)<br>vi. තනතුරක වැඩ බැලීමට/රාජකාරි ඉටුකිරීමට පත්කිරීම<br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>viii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>ix. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>x. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>xi. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| 11. අමාත්‍යාංශයක් යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් (ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ නිලධරයන් හැර) | අදාළ නිලධරයන් අයත් වන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම (තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර) |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | | vi. තනතුරක වැඩ බැලීමට/රාජකාරි ඉටුකිරීමට පත් කිරීම<br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>viii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>ix. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>x. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරුකිරීම<br>xi. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම |
| 12. අමාත්‍යාංශයක් යටතේ නොවන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් (ආධුනික මිනින්දෝරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ සමෘද්ධි කළමනාකරුවන් හැර). | අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා | i. අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම (තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර)<br>vi. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත්කිරීම<br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදාහැරීම<br>viii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>ix. විනය පාලනය සහ සේවයෙන් පහකිරීම<br>x. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධරයන් හැර)<br>xi. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 13. ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ III ශ්‍රේණියේ, II ශ්‍රේණියේ සහ I ශ්‍රේණියේ නිලධරයන් | ස්වදේශ කටයුතු/ රාජ්‍ය පරිපාලන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත සේවා ව්‍යවස්ථාව අනුව II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට උසස් කිරීම<br>vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>vii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>viii. සේවයෙන් පහ කිරීම<br>ix. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව දිස්ත්‍රික් අතර ස්ථාන මාරු කිරීම<br>x. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |
| | අදාළ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති | i. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටුකිරීමට පත්කිරීම<br>ii. විනය පාලනය (සේවයෙන් පහ කිරීම හැර)<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 263 සිට 266 තෙක් වගන්තිවලට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ස්ථාන මාරු සිදුකිරීම (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව)<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරුකිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | අදාළ ප්‍රාදේශීය ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| 14. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීයික මට්ටමේ නිලධරයන් සහ තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට පහළ නිලධරයන් | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුව දිස්ත්‍රික් අතර ස්ථාන මාරු කිරීම<br><br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 263 සිට 266 තෙක් වගන්තිවලට අනුකූලව පරිපාලන දිස්ත්‍රික්ක තුළ පිහිටි ගොවිජන මධ්‍යස්ථාන අතර ස්ථාන මාරු සිදු කිරීම (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව)<br><br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 263 සිට 266 තෙක් වගන්තිවලට අනුකූලව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් තුළ ස්ථාන මාරු සිදු කිරීම (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) |
| | අදාළ පරිපාලන දිස්ත්‍රික්කය භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුව පරිපාලන දිස්ත්‍රික්ක තුළ පිහිටි ගොවිජන මධ්‍යස්ථාන අතර ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ]<br><br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් තුළ ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |

| *I තීරුව* *නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව* *බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව* *පවරන ලද බලතල* |
|---|---|---|
| 15. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් දරන තනතුරුවලට සමාන්තර තනතුරු දරන සමෘද්ධි සංවර්ධන පනතේ 44.(ඉ)(iv) යටතේ අන්තර්ග්‍රහණය වී ඇති නිලධරයන් | සමෘද්ධි විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි 127 සහ 128 වගන්ති යටතේ පරිවාස කාලය දීර්ඝ කිරීම්වලට යටත් වන ස්ථිර කිරීම් හැර, සේවයේ ස්ථිර කිරීම<br><br>ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br><br>iii. අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුව II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට උසස් කිරීම<br><br>iv. අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුව III ශ්‍රේණියේ තනතුරකට හෝ III/II ශ්‍රේණිවල ඒකාබද්ධ තනතුරකට පත් කිරීම (පවත්නා පුරප්පාඩු සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදයක් මඟින් කරනු ලබන පත් කිරීම් හැර)<br><br>v. නිත්‍ය තනතුරට අමතරව මාස තුනකට නොවැඩි කාලයක් සඳහා III ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br><br>vi. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br><br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ]<br><br>viii. වයස සම්පූර්ණ වීම මත සේවය අවසන් කිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 16. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් දරන තනතුරුවලට සමාන්තර තනතුරු දරන සමෘද්ධි සංවර්ධන පනතේ 44.(ඉ)(iv) යටතේ අන්තර්ග්‍රහණය වී ඇති නිලධරයන් | සමෘද්ධි විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | i. නිත්‍ය තනතුරට අමතරව මාස තුනකට නොවැඩි කාලයක් සඳහා අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ තනතුරක වැඩ බැලීමට/ රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>ii. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් සහ ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25 වන වගන්තිය යටතේ විනය පාලනය<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ]<br>iv. වයස සම්පූර්ණ වීම මත සේවය අවසන් කිරීම |
| 17. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති<br>(අ) තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ හැර තෘතීය මට්ටමේ නිලධරයන්<br>(ආ) ප්‍රාථමික සහ ද්විතීයික මට්ටමේ නිලධරයන්<br>දරන තනතුරුවලට සමාන තනතුරු දරන සමෘද්ධි සංවර්ධන පනතේ 44.(ඉ)(iv) යටතේ අන්තර්ග්‍රහණය වී ඇති නිලධරයන් (සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි කළමනාකරුවන් හැර) | සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් | i. සේවයේ ස්ථිර කිරීම<br>ii. පත්වීම අවසන් කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>iv. අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම (තෘතීය මට්ටමේ අධි ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර)<br>v. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>vii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | | viii. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br><br>ix. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br><br>x. වයස සම්පූර්ණ වීම මත සේවය අවසන් කිරීම |
| 18. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන පනතේ 44.(ඉ) (iv) යටතේ අන්තර්ග්‍රහණය වී ඇති පහත සඳහන් නිලධරයන්<br><br>(අ) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්<br><br>(ආ) සමෘද්ධි කළමනාකරුවන් (විශේෂ ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන් හැර) | සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් | i. සේවයේ ස්ථිර කිරීම<br><br>ii. පත්වීම අවසන් කිරීම<br><br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br><br>iv. අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම (සමෘද්ධි කළමනාකරුවන්ගේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර)<br><br>v. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br><br>vi. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br><br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව පරිපාලන දිස්ත්‍රික් අතර ස්ථාන මාරු කිරීම<br><br>viii. වයස සම්පූර්ණ වීම මත සේවය අවසන් කිරීම |
| | අදාළ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) | i. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br><br>ii. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | | iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 263 සිට 266 තෙක් වගන්තිවලට (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) අනුකූලව පරිපාලන දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු සිදු කිරීම |
| | සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂ | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| | ප්‍රාදේශීය ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| 19. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධරයන්<br>(අ) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්<br>(ආ) සමෘද්ධි කළමනාකරුවන් (විශේෂ ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන් හැර) | සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් | i. අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම (සමෘද්ධි කළමනාකරුවන්ගේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හැර)<br>vi. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>vii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>viii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව පරිපාලන දිස්ත්‍රික් අතර ස්ථාන මාරු කිරීම<br>ix. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |

| *I තීරුව*<br>*නිලධර ගණය / ඛණ්ඩය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | අදාළ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) | i. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>ii. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 263 සිට 266 තෙක් වගන්තිවලට (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) අනුකූලව පරිපාලන දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු සිදු කිරීම |
| | සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂ | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| | ප්‍රාදේශීය ලේකම් | i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථාන මාරු කිරීම [263 සිට 266 තෙක් වගන්තිවලට අදාළ ස්ථාන මාරු කිරීම් හැර (263 සහ 266 වගන්ති දෙකද ඇතුළත්ව) ] |
| 20. ඒකාබද්ධ සේවයට අයත් නොවන, අංක: 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ඇමුණුම II) අර්ථ නිරූපණය කර ඇති ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ සිවිල් පරිපාලනය යටතට ගැනෙන ප්‍රාථමික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ නිලධරයන් | ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ සිවිල් පරිපාලනය භාර නිලධරයා | i. අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුව බඳවා ගැනීම<br>ii. සේවයේ ස්ථිර කිරීම<br>iii. පත්වීම අවසන් කිරීම<br>iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම සඳහා කාලය දීර්ඝ කිරීම<br>v. අනුමත බඳවා ගැනීමේ පටිපාටි අනුව උසස් කිරීම<br>vi. තනතුරක වැඩ බැලීමට/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම<br>vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව මුදා හැරීම<br>viii. රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම අනුමත කිරීම<br>ix. විනය පාලනය සහ සේවයෙන් පහකිරීම<br>x. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>xi. සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම |

## "ඇ උපලේඛනය"

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අදාළ කාර්ය පටිපාටික රීතීන්

**II වැනි පරිච්ඡේදය**

**අභිනියෝජනය කර ඇති බලය ක්‍රියාත්මක කිරීම**

12. බලය අභිනියෝජිත කමිටුවක් හෝ බලය අභිනියෝජිත නිලධරයෙකු හෝ එම අභිනියෝජිත බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වගකිව යුතු සහ උත්තර දිය යුතු වන්නේ ය.

13. රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බලතල කිසියම් කමිටුවක් වෙත අභිනියෝජනය කර ඇති කල්හි කමිටුවේ සාමාජිකයින් විසින් එම බලතල සාමූහික වශයෙන් ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය.

14. බලය අභිනියෝජිත බලධරයා විසින්ම පමණක් එම අභිනියෝජිත බලතල ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය. එම බලතල වෙනත් තැනැත්තෙකුට **හෝ** කමිටුවකට හෝ අභිනියෝජනය නොකළ යුතු වන්නේ ය.

15. ඉහත 14 වන වගන්තියෙහි දැක්වෙන විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තෙකු හෝ කමිටුවක් හෝ විසින් සිදු කරන ලද සියලු ක්‍රියා හා ගන්නා ලද සියලු තීරණ බල රහිත වන්නේ ය. එවැනි ක්‍රියාවක් හෝ තීරණයක් හෝ මඟින් සිදු වන හානිය හෝ පාඩුව පිළිබඳව ඒ සඳහා අවසර දෙන හෝ අවකාශ සලසන බලය අභිනියෝජිත බලධරයා මෙන්ම, එම බලය ක්‍රියාත්මක කරන තැනැත්තා හෝ කමිටුව හෝ පෞද්ගලිකව ම වගකිව යුතු වන්නේ ය.

16. බලය අභිනියෝජිත බලධරයා තම බල අභිනියෝජනයේ විෂය පථය හා සීමාවන් තුළ සිටිමින් ස්වකීය බලතල ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය. එම බලය අභිනියෝජනයේ විෂය පථය හා සීමාවන් ඉක්මවා සිදු කරනු ලබන ක්‍රියා හෝ ගන්නා ලද තීරණ හෝ බල රහිත වන්නේ ය. එවැනි ක්‍රියා හෝ තීරණ මඟින් සිදු වන හානිය හෝ පාඩුව පිළිබඳව එම බලය අභිනියෝජිත බලධරයා හෝ කමිටුවක් වන කල්හි කමිටුවේ සියලු සාමාජිකයින් පෞද්ගලිකවම වගකිව යුතු වන්නේ ය.

17. බලය අභිනියෝජිත බලධරයකු විසින් එම බලය ක්‍රියාත්මක කිරීමේ දී, කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන කාර්ය පටිපාටික රීති, මාර්ගෝපදේශ, ක්‍රියා පටිපාටි හා රෙගුලාසි අනුව හැර වෙනත් කවර හෝ තැනැත්තෙකුගේ උපදෙස් හෝ නියෝග මත හෝ බලපෑම් යටතේ යම් තීරණ ගැනීමක් හෝ ක්‍රියා සිදු කරන්නේ නම්, එබඳු තීරණ ගැනීම් හෝ ක්‍රියා සිදු කිරීම්, රජයේ නිලධරයන් සම්බන්ධයෙන් වන විනය කාර්ය පටිපාටියෙහි දැක්වෙන වැරදි පිළිබඳ පළමුවන උපලේඛනයෙහි සඳහන් වරදක් සේ සලකනු ලබන්නේ ය. එබඳු තීරණ හෝ ක්‍රියා ශූන්‍ය හා බල රහිත වන්නේ ය. එබඳු තීරණ හෝ ක්‍රියා මගින් සිදුවන හානි හා පාඩු පිළිබඳව එම බලය අභිනියෝජිත බලධරයා හෝ කමිටුවක් වන කල්හි එහි සියලු සාමාජිකයන් පෞද්ගලිකවම වගකිව යුතු වන්නේ ය. එසේවුවද වුවත්, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව නිසි බලය සහිත අධිකරණයක් විසින් දෙනු ලබන තීරණයක් මත ක්‍රියා කිරීමට මෙම වගන්තියෙන් කිසිදු බාධාවක් ඇති නොවන්නේ ය.

18. බලය අභිනියෝජිත බලධරයා විසින් එම බලය කාර්ය පටිපාටික රීති, මාර්ගෝපදේශ, ක්‍රියාපටිපාටි හා රෙගුලාසිවලට අනුකූලවත්, අපක්ෂපාතවත්, සාධාරණවත්, සද්භාවයෙන් හා විනිවිදභාවයෙන් යුතුවත් ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය.

19. තමා වෙත පවරා ඇති කාර්යයන් අනලස්ව ඉටු කිරීමට බලය අභිනියෝජිත බලධරයා ක්‍රියා කළ යුතු වන අතර, තම පාලනයෙන් පරිබාහිර හේතු මත කිසියම් ප්‍රමාදයක් සිදු වන්නේ නම් එම බලධරයා විසින් ඒ බැව් කොමිෂන් සභාව වෙත වහාම වාර්තා කළ යුතු වන්නේ ය.

20. බලය අභිනියෝජිත බලධරයා විසින් අවශ්‍යතාවක් මතු වන විටෙක දී කොමිෂන් සභාවේ සහාය සහ උපදේශය ලබා ගත යුතු වන්නේ ය.

21. මෙම කාර්ය පටිපාටික රීති මඟින් ආවරණය නොවන කුමන කරුණක් හෝ අර්ථ නිරූපණයක් හෝ පිළිබඳ තීරණ කොමිෂන් සභාව විසින් ගනු ලැබිය යුතු වන්නේ ය.

**XX වැනි පරිච්ඡේදය**

**රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ලේඛන හා වාර්තා සකස් කිරීම**

288. සෑම බලය අභිනියෝජිත බලධරයෙක් ම, සෑම පරිපාලන බලධරයෙක් ම, සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ම හා සෑම ආයතන ප්‍රධානියෙක් ම තමන්ගේ විෂය පථයට ඇතුළත් වන සියලුම රජයේ නිලධරයන් පිළිබඳව අදාළ සියලු තොරතුරු ඇතුළත් පහත සඳහන් ලේඛන, පහත සඳහන් පරිශිෂ්ට ප්‍රකාරව අඛණ්ඩව හා යාවත්කාලීනව පවත්වා ගත යුතු වන්නේ ය.

| *අනු අංකය* | *පරිශිෂ්ට අංකය* | *පවත්වා ගත යුතු ලේඛනය* |
|---|---|---|
| I. | 21 | රජයේ නිලධරයන්ගේ පත්කිරීම් හා උසස් කිරීම් සම්බන්ධව බලය අභිනියෝජිත බලධරයා විසින් පවත්වා ගත යුතු ලේඛනය |
| II. | 22 | සේවයෙන් පහ කළ රජයේ නිලධරයන් සම්බන්ධව බලය අභිනියෝජිත බලධරයා විසින් පවත්වා ගත යුතු ලේඛනය |
| III. | 23 | සේවයෙන් ඉල්ලා අස් වූ රජයේ නිලධරයන් සම්බන්ධව බලය අභිනියෝජිත බලධරයා විසින් පවත්වා ගත යුතු ලේඛනය |
| IV. | 24 | තනතුර අතහැර ගිය රජයේ නිලධරයන් සම්බන්ධව බලය අභිනියෝජිත බලධරයා විසින් පවත්වා ගත යුතු ලේඛනය |
| V. | 25 | වැඩ තහනම් කර ඇති හා අනිවාර්ය නිවාඩු ගන්වා ඇති රජයේ නිලධරයන් සම්බන්ධව බලය අභිනියෝජිත බලධරයා විසින් පවත්වා ගත යුතු ලේඛනය |
| VI. | 26 | විශ්‍රාම ගන්වනු ලැබූ රජයේ නිලධරයන් සම්බන්ධව බලය අභිනියෝජිත බලධරයා විසින් පවත්වා ගත යුතු ලේඛනය |
| VII. | 27 | සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වන ලද රජයේ නිලධරයන් සම්බන්ධව බලය අභිනියෝජිත බලධරයා විසින් පවත්වා ගත යුතු ලේඛනය |
| VIII. | 28 | සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පික විකල්පයක් ලෙස විශ්‍රාම ගැන් වූ රජයේ නිලධරයන් සම්බන්ධව බලය අභිනියෝජිත බලධරයා විසින් පවත්වා ගත යුතු ලේඛනය |
| IX. | 29 | කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් පිළිබඳව බලය අභිනියෝජිත බලධරයා විසින් කොමිෂන් සභාව වෙත සපයනු ලබන අර්ධ වාර්ෂික වාර්තාව (රජයේ නිලධරයන්ට අදාළ සංඛ්‍යාත්මක දත්ත කොමිෂන් සභාව වෙත අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කිරීම) |
| X. | 30 | සෑම රජයේ කාර්යාලයකම/ආයතනයකම සමස්ත කාර්ය මණ්ඩලය සම්බන්ධව පවත්වා ගත යුතු ලේඛනය |

289. ඉහත 288 වන වගන්තියේ සඳහන් පරිදි පවත්වා ගෙන යනු ලබන ලේඛනයන්හි ඇතුළත් දත්තවල සංඛ්‍යාත්මක සාරාංශයක් අංක 29 වන පරිශිෂ්ටය ප්‍රකාරව අර්ධ වාර්ෂිකව අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට යථායෝග්‍ය පරිදි, බලය අභිනියෝජිත බලධරයා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා ක්‍රියා කළ යුතු වන්නේ ය. ඉන්පසුව, අමාත්‍යාංශ ලේකම්වරයා සෑම වසරක ම ජූනි මස 30 වැනි දිනට හා දෙසැම්බර් මස 31 වැනි දිනට නියමිත දත්ත පිළිවෙළින් ජූලි මස 31 සහ ජනවාරි මස 31 යන දිනවලට පෙර කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතු වන්නේ ය.

EOG 12 - 0189

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.